ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

# මාධ්‍ය නිවේදනය

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ස්වයං මෙහෙයවීමෙන් 2022.10.28 වන දින තිහගොඩ නායිම්බල ප්‍රදේශයේ පාසල් සිසුවකුට වෙඩි තැබීම සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණයක් ආරම්භ කරන ලදි. උක්ත කරුණට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය මගින් 2022.10.29 දින සිද්ධියට අදාළ ස්ථානය පරීක්ෂා කිරීම, සහ ත්‍රීරෝද රථයේ ගමන් ගත් අනෙකුත් දරුවන් හමුවී ප්‍රකාශ ලබා ගැනීම සිදු කළ අතර, ප්‍රදේශවාසීන් හමුවී සාකච්ඡා කිරීම සිදුකර සාමකාමී ලෙස කටයුතු කිරීමේ වැදගත්කම පැහැදිලි කර දීම සිදු කරන ලදි. මෙම සිද්ධිය සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණ මාතර ප්‍රාදේශීය කාර්යාලය මගින් සිදුකරන අතර, පරීක්ෂණ ප්‍රතිඵල සුදුසු නිර්දේශයන් යොමු කිරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයට යොමු කරනු ලැබේ.

විනිසුරු රොහිනි මාරසිංහ
සභාපතිනි
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
2022.10.30